# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

### අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (III) කොටස-පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2015

## SC 408 - පාසල් උපදේශනය

### පැය තුනයි (03)

**පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට ද දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.**

---

I – කොටස

1. i. "මාර්ගෝපදේශනය" අර්ථ දක්වන්න.

   ii. පාසෝනියන් ආකෘතියෙහි සාකච්ඡා වන "පුද්ගල විශ්ලේෂණය" යනු කුමක්ද?

   iii. සාම්ප්‍රදායික උපදේශන ක්‍රමශිල්ප හතරක් නම් කරන්න.

   iv. විභාගය ආශ්‍රිතව ශිෂ්‍යයකු හට ඇතිවිය හැකි මානසික පීඩනය ආශ්‍රිත ලක්ෂණ හතරක් නම් කරන්න.

   v. භීතිකා යනු කුමක්ද?

   vi. උපදේශන සැසියකදී පාසල් උපදේශකවරයකු විසින් ඇසිය හැකි ප්‍රශ්න වර්ග දෙක සඳහා උදාහරණ 2 ක් සඳහන් කරන්න.

   vii. සමාජමිතික ක්‍රම ශිල්පයේදී සමාජමිතික ප්‍රස්තාරය ලෙස අදහස් කරන්නේ කුමක්ද?

   viii. උපදේශනයේදී පසු විපරම් සැසි වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

   ix. ඇල්බට් එලිස්ගේ න්‍යායයෙහි හඳුන්නවා දුන් A, B, C, D, E, F සූත්‍රය නම් කරන්න.

x. පාසල් උපදේශන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

## II - කොටස

1. i. "උපදේශනය" යන්න නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

ii. ශ්‍රී ලංකාවේ උපදේශන සේවාවේ වැදගත් සංදිස්ථාන හයක් නම් කරන්න.

(ලකුණු 6)

iii. වර්තමාන පාසලට උපදේශන සේවාවක අවශ්‍යතාව මතු වී තිබේ. උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

2. i. උපදේශන ආචාරධර්ම 5 ක් නම් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. පාසල් උපදේශකවරයා විසින් ආචාරධර්ම සුරැකීමේ වැදගත්කම උදාහරණ ගෙනහැර දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3. i. උපදේශනයේ ප්‍රධාන ක්ෂේත්‍ර හතර නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

ii. "පාසල් උපදේශකවරයා උපදේශනය හා සම්බන්ධ දැනුම, ආකල්ප හා කුසලතාවලින් යුත් අයකු විය යුතු වේ." උපදේශකවරයකුගේ පෞරුෂ ගුණාංග ඇසුරු කර ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

4. i. චර්යා නිරීක්ෂණය කර ලබාගන්නා තොරතුරු සටහන් කිරීම සඳහා ලුහුඬු වාර්තා හා සංඛ්‍යාත්මක ප්‍රමාණන පරිමාණ යොදාගත හැකි ආකාරය කෙටියෙන් විසිත් කරන්න.

(ලකුණු 10)

ii. උපදේශකවරයා සේවාලාභියා සමඟ සුහද අන්තර් පුද්ගල සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සඳහා ප්‍රාරම්භක චර්යා වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. i. මොරිල් (Morill), ඔටින් (Oetting) හා හර්ස්ට් (Hurst) ට අනුව උපදේශනයේ අරමුණු පැහැදිලි කරන්න.

(ලකුණු 8)

ii. වෘත්තීය උපදේශනය සම්බන්ධව ඉදිරිපත් කළ එලී ගීන්ස්බර්ගේ න්‍යාය හෝ ඈන් රෝ ගේ න්‍යාය පිළිබඳ අවබෝධය උපදේශකවරයාට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

6. i. පාසල් උපදේශකවරයෙක් උපදේශන න්‍යායන් පිළිබඳ අවබෝධය ලබාතිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. මනෝවිශ්ලේෂණවාදී න්‍යාය හෝ සංජානනික හා ප්‍රපංචමය න්‍යාය ඇසුරින් පුද්ගල ගැටලුවක් ඇතිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)